ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 1960/4 - 2016 මාර්තු මස 28 වැනි සඳුදා - 2016.03.28

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. 21/1978(X)

### 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත

25අ වගන්තිය යටතේ වූ නියමය

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 25අ වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍ය ලක්ෂ්මන් කිරිඇල්ල වන මා විසින්, 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ ලියාපදිංචි අංක PV 64641 දරන ශ්‍රී ලංකාවේ සමාගමක් වශයෙන් සංස්ථාගත කරනු ලැබූ සවුත් ඒසියන් ඉන්ස්ටිටියුට් ඔෆ් ටෙක්නොලොජි ඇන්ඩ් මෙඩිසින් ලිමිටඩ් සම්බන්ධයෙන් ඉහත කී පනතේ 70ඇ වගන්තිය යටතේ වාර්තාවක් ලබා ගැනීමෙන් පසුව, මෙහි 1 වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති කොන්දේසිවලට යටත්ව, මෙහි II වන උපලේඛනයේ II වන තීරයේ අනුරූප සටහන්වල නිශ්චිතව දක්වා ඇති කෙටි යෙදුම්ද සහිතව, මෙහි II වන උපලේඛනයේ I වන තීරයේ නිශ්චිතව දක්වා ඇති උපාධි ප්‍රදානය කිරීම සිදුකරනු ලබන උසස් අධ්‍යාපනය දියුණු කිරීමේ කාර්යය සඳහා උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් වශයෙන් එකී සවුත් ඒසියන් ඉන්ස්ටිටියුට් ඔෆ් ටෙක්නොලොජි ඇන්ඩ් මෙඩිසින් ලිමිටඩ් පිළිගනිමි.

### I වන උපලේඛනය

*කොන්දේසි*

1. (මෙහි මින් මතු "ආයතනය" යනුවෙන් සඳහන් කරනු ලබන) සවුත් ඒසියන් ඉන්ස්ටිටියුට් ඔෆ් ටෙක්නොලොජි ඇන්ඩ් මෙඩිසින් ලිමිටඩ්, උපාධි ප්‍රදානය කිරීමේ තත්ත්වය පිරිනැමීමේ දින සිට මාස දෙකක කාලයක් අවසන් වීමට පෙර නිශ්චිත බලධරයා වෙත පහත දැක්වෙන පරිදි යථා පරිදි සංශෝධනය කරනු ලබන ස්වකීය සාංගමික ව්‍යවස්ථාවලිය ද ඉදිරිපත් කරනු ලැබිය යුතුය. එනම්,

   (අ) උසස් අධ්‍යාපනය සාංගමික ව්‍යවස්ථාවේ අරමුණක් වශයෙන් නිශ්චිතව දක්වනු ලැබිය යුතුය.

   (ආ) සමාගම ස්වේච්ඡාවෙන් ඈවර කිරීමට පෙරාතුව එසේ සමාගම ඈවර කිරීම පිළිබඳව නිශ්චිත බලධරයා වෙත දැනුම් දෙනු ලබන බවට එකඟවිය යුතුය.

2. උපාධි ප්‍රදානය කිරීමේ තත්ත්වය ප්‍රදානය කිරීමේ දින සිට මාස දොළහක (12) කාලයක් ඉකුත්වීමට පෙරාතුව ආයතනය විසින් නිශ්චිත බලධරයා වෙත පහත දැක්වෙන තොරතුරු සපයනු ලැබිය යුතු ය.

   (i) අදාළ උපාධි වැඩසටහන් සඳහා වූ අවශ්‍යතා සපුරාලනු පරිදි සුදුසුකම් ලත් අධ්‍යයන හා අනධ්‍යයන කාර්යය මණ්ඩල බඳවා ගැනීම පිළිබඳ සාධක,

(ii) විශ්වවිද්‍යාල ප්‍රතිපදාන කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලබන ක්‍රමවේද ප්‍රකාරව අධ්‍යයන කාලසීමා සඳහා වූ අධ්‍යයන වැඩසටහනක්,

(iii) අදාළ උපාධි වැඩසටහන් සඳහා අවශ්‍ය වන අධ්‍යයන පොත්, අත්පොත්, නිර්දේශිත කියවීම් පොත් සහ වෙනත් ප්‍රමාණවත් අධ්‍යයන ද්‍රව්‍ය පිළිබඳ සාධක ; සහ

(iv) අදළ උපාධි වැඩසටහන් සඳහා අවශ්‍ය පර්යේෂණ කටයුතු පවත්වාගෙන යාම සඳහා සිසුන්ට හැකිවන පරිදි සියලු අවශ්‍ය පොත් සහ ද්‍රව්‍ය සමගින් මනා ලෙස නවීකරණය වූ පුස්තකාලයක් පැවතීම පිළිබඳ සාධක,

(v) අදළ පර්යේෂණ කටයුතුවල යෙදීම සඳහා කාර්ය මණ්ඩලයේ අවශ්‍යතා නිශ්චිතව දැක්වීම හා එම පර්යේෂණ ශ්‍රී ලංකාවේ වාර වාර්තාවල පළ කිරීම.

3. උපාධි ප්‍රදානය කිරීමේ තත්ත්වය ප්‍රදානය කිරීමේ දින සිට අවුරුදු තුන (03) ක කාලයක් අවසන් වීමට පෙරාතුව සිවිල් ඉංජිනේරු උපාධි පාඨමාලාවේ ඉංජිනේරු විද්‍යා උපාධිය සඳහා ආයතනය විසින් පහත දැක්වෙන විද්‍යාගාර පිහිටුවනු ලැබිය යුතු ය.

(i) ද්‍රව්‍ය සහ යාන්ත්‍ර විද්‍යාව පිළිබඳ විද්‍යාගාරය,
(ii) මිනුම් විද්‍යාගාරය,
(iii) ව්‍යුහ පරීක්ෂණ විද්‍යාගාරය,
(iv) භූතාක්ෂණික විද්‍යාගාරය,
(v) හයිඩ්‍රොලික් විද්‍යාගාරය.

4. උපාධි ප්‍රදානය කිරීමේ තත්ත්වය පිරිනැමීමේ දින සිට අවුරුදු දෙක (02) ක කාලයක් ඇතුලත යාන්ත්‍ර ඉලෙක්ට්‍රොනික ඉංජිනේරු විද්‍යාව පිළිබඳ විද්‍යා උපාධිය සඳහා අවශ්‍ය පවත්නා පහත දැක්වෙන විද්‍යාගාර පහසුකම් ආයතනය විසින් ප්‍රවර්ධනය කරනු ලැබිය යුතුය. එනම්,

(i) රොබෝම විද්‍යාව හා කෘත්‍රිම බුද්ධි විද්‍යාගාරය,
(ii) කාර්මික යන්ත්‍ර මෙහෙයුම්කරණය සහ ක්‍රියාවලි පාලන විද්‍යාගාරය,
(iii) ඉලෙක්ට්‍රොනික, උපාංග සම්පාදන සහ බලාගාර පද්ධති විද්‍යාගාරය,
(iv) ඉංජිනේරු වැඩපල.

5. උපාධි ප්‍රදානය කිරීමේ තත්ත්වය පිරිනැමීමේ දින සිට එක් (01) අවුරුදු කාලයක් ඇතුලත ආයතනය විසින් යාන්ත්‍ර ඉංජිනේරු විද්‍යාව පිළිබඳ ඉංජිනේරු විද්‍යා උපාධිය සඳහා අවශ්‍ය වන තත්ත්ව සහතික යාන්ත්‍රන ක්‍රියාත්මක කිරීම පිළිබඳ සාධකයක් නිශ්චිත බලධරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

II වන උපලේඛනය

| *I වන තීරය*<br>*උපාධි වැඩසටහන්* | *II වන තීරය*<br>*උපාධි පිළිබඳ කෙටියෙදුම්* |
|---|---|
| යාන්ත්‍රික ඉංජිනේරු විද්‍යාව පිළිබඳ ඉංජිනේරු විද්‍යා උපාධිය | බීඑස්සී(ඉංජිනේරු) (යාන්ත්‍ර විද්‍යුත් ඉංජිනේරු)<br>BSc (Eng) (Mechatronics Eng.) |
| සිවිල් ඉංජිනේරු විද්‍යාව පිළිබඳ ඉංජිනේරු විද්‍යා උපාධිය | බීඑස්සී(ඉංජිනේරු) (සිවිල් ඉංජිනේරු)<br>BSc (Eng) (Civil Eng.) |

මේ නියෝගයේ "නිශ්චිත බලධරයා" යන්නෙන් උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශය විෂය පවරා ඇත්තා වූ අමාත්‍යාංශයේ ලේකම්වරයා අදහස් වේ.

සවුත් ඒෂියන් ඉන්ස්ටිටියුට් ඔෆ් ටෙක්නොලොජි ඇන්ඩ් මෙඩිසින් ලිමිටඩ් සම්බන්ධයෙන් ඉහත සඳහන් පනතේ 25අ වගන්තිය යටතේ සාදන ලද 2015 මැයි මස 07 වන දිනැති සහ අංක 1913/14 දරන *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද නියමය, යටතේ නීත්‍යානුකූලව කරන ලද කිසිවකට අගති විරහිතව එකී නියමය මෙයින් පරිච්ඡින්න කරනු ලැබේ.

ලක්ෂ්මන් කිරිඇල්ල,
උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍ය.

2016 මාර්තු මස 21 වැනි දින,
කොළඹ දී ය.

04-528

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.